ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2394/68 - 2024 ජූලි මස 26 වැනි සිකුරාදා - 2024.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

එල්.ඩී.-බී 3/2021 (**III**)

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 54 වන වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ට) ඡේදය යටතේ, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රනිල් වික්‍රමසිංහ,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 ජූලි මස 26 වන දින,
කොළඹ දී ය

නියෝග

1. මේ නියෝග 2024 අංක 03 දරන කොළඹ වරාය නගරය (සභාධිපත්‍ය දේපළ කළමනාකරණය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

I වන කොටස

පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පිළිබඳ සහතිකය නිකුත් කිරීම

2. (1) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය සහ සුබසාධනය උදෙසා සපයන ලද පොදු පහසුකම් පිළිබඳව සෑහීමට පත්විය හැකි බවටත් සහාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග පාලනය කිරීම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හෝ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් යොදා ඇති වැඩපිළිවෙල පිළිබඳව සෑහීමට පත්විය හැකි බවටත් සහතික කරමින් කොමිෂන් සභාවෙන් සහතිකයක් ලබා ගැනීම සඳහා, බද්ධ නිවාස අයිතිකම් පනතේ 3අ වන වගන්තියේ (2) වන උපවග න්තියේ (එ) ඡේදය යටතේ ඉල්ලීමක් කිරීමට අදහස් කරන යම් සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් ඉල්ලුම්පත්‍රයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) යෝජිත ගොඩනැගිල්ල සඳහා සපයනු ලැබිය යුතු බවට නියම කර ඇති පොදු පහසුකම් අනුමත ගොඩනැගිලි සැලැස්මෙහි සලසා ඇති බවටත් යෝජිත ගොඩනැගිල්ලේ පොදු අංගෝපාංග ඒ පොදු අංගෝපාංග යථා පරිදි පාලනය කිරීම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හෝ කළමනාකරණය කිරීම සහතික කිරීම පිණිස කළමනාකරණ සංස්ථාව විසින් යෝජිත ගොඩනැගිලි සැලැස්මෙහි නිසි පරිදි සැලසුම් කර ඇති බවටත් සහතික කරමින් කොමිෂන් සභාවෙන් සහතිකයක් ලබා ගැනීම සඳහා, බද්ධ නිවාස අයිතිකම් පනතේ 3ආ වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ ඉල්ලීමක් කිරීමට අදහස් කරන යම් තාවකාලික සහාධිපත්‍ය දේපළක අයිතිකරු හෝ අයිතිකරු සහ සංවර්ධකයා විසින්, මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් ඉල්ලුම්පත්‍රයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය සහ සුබසාධනය උදෙසා සපයන ලද පොදු පහසුකම් පිළිබඳව සෑහීමට පත්විය හැකි බවටත් සහ සහාධිපත්‍ය දේපළේ පොදු පහසුකම් පාලනය කිරීම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හෝ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් යොදා ඇති වැඩපිළිවෙල පිළිබඳව සෑහීමට පත්විය හැකි බවටත් සහතික කරමින් කොමිෂන් සභාවෙන් සහතිකයක් ලබා ගැනීම සඳහා, බද්ධ නිවාස අයිතිකම් පනතේ 3ඇ වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) වන ඡේදය යටතේ ඉල්ලීමක් කිරීමට අදහස් කරන යම් අර්ධ සහාධිපත්‍ය දේපළක අයිතිකරු හෝ අයිතිකරු සහ සංවර්ධකයා විසින්, මෙහි III වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් ඉල්ලුම්පත්‍රයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. (1) 2 වන නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් ම අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය දේපළේ, තාවකාලික සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ අයිතිකරු හෝ අයිතිකරු සහ සංවර්ධකයා විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර, පහත දැක්වෙන ලේඛන පිටපත් තුනකින් යුක්තව ඒ සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:-

(අ) බලයලත් මිනින්දෝරුවරයකු විසින් හෝ, සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ සකස් කර අදින ලද, අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය පිඹුර, තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර;

(ආ) මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ක්ෂේත්‍රවල නිසි පරිදි සුදුසුකම්ලත් තැනැත්තන් විසින් අත්සන් කරන ලද පොදු පහසුකම්වලට අදාළ සේවා සහ සැලසුම් පිළිබඳ වාර්තාවක්;

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අදාළ ගොඩනැගිලි සැලැස්ම;

(ඈ) තාවකාලික සහාධිපත්‍ය දේපළක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක් හා සම්බන්ධ ඉල්ලුම් පත්‍රයක් වන විට දී, ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වලංගු ගොඩනැගිලි අවසර පත්‍රයක්;

(ඉ) සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් වන විට දී, සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ල සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අනුකූලතා සහතිකයක්;

(ඊ) වරලත් සිවිල් ඉංජිනේරුවකු විසින් නිකුත් කරන ලද ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක සැලැස්ම සහ සහතිකයක්;

(උ) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් පිළිගත් රක්ෂණ සමාගමක් විසින් නිකුත් කරන ලද රක්ෂණ සහතිකයක්; සහ

(ඌ) සහාධිපත්‍ය ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩමට අදාළව, අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් සහිත බලයලත් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් නිකුත් කරන ලද හිමිකම් වාර්තාවක්.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන අනුනියෝගයේ සඳහන් කරන ලද ලේඛනවලට අමතරව, එම කාර්යය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් ලේඛන ඉල්ලා සිටිය හැකි ය.

4. 2 වන නියෝගය යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලුම්පත්‍රයක් සලකා බැලීමේ කාර්යය සඳහා, 3 වන නියෝගයේ සඳහන් කරන ලද ලේඛනවලට අමතරව, යෝජිත සංවර්ධන කටයුතුවල යෝග්‍යතාව පිළිබඳව කොමිෂන් සභාවට සෑහීමට පත්වීමට අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි, දේපළෙහි ඉදිරි නඩත්තු කටයුතු සම්බන්ධයෙන් සලසනු ලැබ ඇති වැඩපිළිවෙල දැක්වෙන යම් සහතික කරන ලද තොරතුරු යම් සැලසුම් ද සමඟ ඉදිරිපත් කරන ලෙසට අයිතිකරු වෙත නියම කරනු ලැබිය හැකි ය.

5. 2 වන නියෝගය යටතේ ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කරන ලද, අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය පිඹුර, තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර-

(අ) බද්ධ නිවාස අයිතිකම් පනතේ විධිවිධානවල නියමයන්ට සහ මේ නියෝගවල අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය; *සහ*

(ආ) පහත අනුපිළිවෙල අනුව විය යුතු යː-

(i) පිටකවරය;
(ii) පටුන;
(iii) සංකේත විස්තර සටහන සහිතව ඉඩම සහ ගොඩනැගිල්ල නිරූපණය කරන මිනින්දෝරු පිඹුර;
(iv) ගොඩනැගිලි වර්ගය සහ ගොඩනැගිල්ලේ භාවිතය සහ හිමිකම් පිළිබඳ විස්තර;
(v) මායිම් සහිතව සහාධිපත්‍ය කොටස්, අතිරේක කොටස් සහ පොදු අංගෝපාංග දැක්වෙන අවශ්‍ය විස්තර සහිත මහල් පිළිබඳ සැලැස්ම;
(vi) එම සහාධිපත්‍ය දේපළේ මායිම්, වරිපනම් අංකය, මායිම් විස්තර, වර්ග ප්‍රමාණය සහ කොටස් වටිනාකමෙහි ප්‍රතිශතය අන්තර්ගත වන උපලේඛනය;
(vii) පොදු අංගෝපාංග ලැයිස්තුව;
(viii) එක් එක් කොටසේ මිනුම් ප්‍රමාණ;
(ix) සිරස් හරස්කඩ; සහ
(x) කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් විස්තර.

6. සහාධිපත්‍ය පිඹුර, තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර සකස් කිරීමේ දී, පහත දැක්වෙන අවශ්‍යතාවලට අනුකූල විය යුතු යː-

(අ) පිඹුර පිටපත් තුනකින් යුක්ත විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, එම එක් එක් පිඹුරේ මුල් පිටුවෙහි "මුල් පිටපත", "දෙවන පිටපත" සහ "තුන්වන පිටපත" යන වචන පැහැදිලිව කියවිය හැකි පරිදි සටහන් කළ යුතු ය;

(ආ) පිඹුරේ සෑම පිටුවකම දකුණුපස ඉහළ කෙළවරෙහි, අවස්ථාවෝචිත පරිදි, "සහාධිපත්‍ය පිඹුර", "තාවකාලික සහාධිපත්‍ය පිඹුර", "අර්ධ සහාධිපත්‍ය පිඹුර","නැවත බෙදා වෙන් කිරීමේ පිඹුර" හෝ "ඒකාබද්ධ කරන ලද පිඹුර" යන වචන, පිඹුරේ අංකය ද සමඟ සටහන් කළ යුතු අතර, පිඹුරේ කාර්යය ද නිශ්චිතව දැක්විය යුතු ය;

(ඇ) පිඹුරේ සෑම පිටුවකම දකුණුපස ඉහළ කෙළවරෙහි පහත දැක්වෙන ආකාරයට අංකනය කළ යුතු ය; එනම්, පිටු 10 ක් ඇති විට, මුල් පිටුවෙන් ආරම්භ වී සෑම පිටුවක්ම 10 න් 1, 10 න් 2, 10 න් 3 ආදී වශයෙන් වේ;

(ඈ) පිඹුර "සම්මත "A" කඩදාසියක් භාවිතයෙන් සකස් කළ යුතු අතර, එක් වෙළුමකට වඩා වැඩි ගණනක් ඇත්නම් සහ පළමු වෙළුමට පිටු 10 ක් ඇත්නම්, දෙවන වෙළුම අඛණ්ඩ අංක 20 න් 11 ලෙස ආරම්භ කළ යුතු ය;

(ඉ) පිඹුර මුද්‍රිත විය යුතු අතර, එය පිටකවරයකින් සහ පටුනකින් සමන්විත විය යුතු ය. එහි කොළ සකස් කිරීමේ දී 5(ආ) වන නියෝගයේ දක්වා ඇති අනුපිළිවෙල අනුගමනය කළ යුතු ය. පිටුවක ඝනකම වර්ග මීටරයට ග්‍රෑම් 120 හෝ ඊට වැඩි විය යුතු ය. (පිටුවක බර එක් වර්ග මීටරයකට ග්‍රෑම් 120 කට වැඩි විය යුතු ය.) පිඹුර ශක්තිමත්ව බඳින ලද පොතක ආකාරයට සකස් කළ යුතු ය. පිටකවරයේ, පිඹුරේ කාර්යය සහ අංකය සහ මිනින්දෝරුවරයාගේ ලිපිනය සහ වෙනත් අදාළ විස්තර මුද්‍රණය කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක් හෝ පින්තූර ඇතුළත් නොවිය යුතු ය; සහ

(ඊ) අදාළ පිඹුර සකස් කරනු ලැබූ මිනින්දෝරුවරයා විසින් පිඹුරේ සෑම පිටුවකම අත්සන් කර ඔහුගේ මුද්‍රාව තැබිය යුතු ය.

7. සහාධිපත්‍ය පිඹුරක, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක විස්තර පහත දැක්වෙන ආකාරයට පෙන්නුම් කරනු ලැබිය යුතු යː-

(අ) සහාධිපත්‍ය කොටසක කොටස් අභ්‍යන්තර ප්‍රවේශයක් සහිත මහල් දෙකකින් හෝ වැඩි ප්‍රමාණයකින් සමන්විත වන අවස්ථාවල දී, එක් එක් මහල සම්බන්ධයෙන්, පිඹුරේ ඉහළින්ම පිහිටි සහාධිපත්‍ය කොටසේ කොටස් "1 වන මහලේ කොටස", "2 වන මහලේ කොටස" ආදී වශයෙන් එක් එක් කොටසේ මායිම් සහිතව දැක්විය යුතු අතර 5(ආ) (vi) වන නියෝගය යටතේ සකස් කරන ලද උපලේඛනයේ එහි භාවිතය දැක්විය යුතු ය. සහාධිපත්‍ය කොටසේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය, එක් එක් සහාධිපත්‍ය කොටසෙහි විස්තර සහිතව ගණනය කළ යුතු අතර අදාළ කොටසෙහි වටිනාකමෙහි ප්‍රතිශතය ද දැක්විය යුතු ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය දේපළක්, තාවකාලික සහාධිපත්‍ය දේපළක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක් ඉදිකිරීමට නියමිත අවස්ථාවක දී, අදාළ සහාධිපත්‍ය පිඹුරෙහි, ගොඩනැගිල්ලේ මතුපිට මායිම් දැක්වෙන රේඛාංකනයට අමතරව, ගොඩනැගිල්ලට පිටතින් ඉඩම්වල මායිම් මත පිහිටන පොදු කානු, දිය බස්නා වළවල් සහ පූති ටැංකි වැනි සියලු පොදු අංගෝපාංග දැක්විය යුතු ය. පවත්නා ගොඩනැගිල්ලකින් යෝජිත ගොඩනැගිල්ලක් වෙන් කොට හඳුනා ගැනීම සඳහා සලකුණු දක්වා තිබිය යුතු ය;

(ඇ) සෑම ගොඩනැගිල්ලක් සඳහා ම පරිමාණය 1:100 හෝ 1:200 විය යුතු සිරස් හරස්කඩක් ඇඳිය යුතු අතර, මහල් දෙකක් අතර උස සහ එක් එක් මහල් බිමේ ඝනකම දැක්විය යුතු ය ;

(ඈ) සහාධිපත්‍ය කොටසක දළ වර්ග ප්‍රමාණය ගණනය කිරීමේ දී පිටත බිත්තිවල මධ්‍ය රේඛාව මායිම සේ සැලකිය යුතු අතර, එක් වර්ග මීටරයකට වැඩි කොන්ක්‍රීට් කණු, සේවා නළ සහ පොදු අවකාශ එම ගණනය කිරීමෙන් ඉවත් කළ යුතු ය;

(ඉ) අතිරේක කොටසේ බිම් ප්‍රමාණය ඇතුළුව බිම් ප්‍රමාණය, පොදු අංගෝපාංග භාවිත වන ප්‍රමාණය, එය පිහිටා ඇති කොටසේ මට්ටම සහ එය පිහිටන ස්ථානය මත පදනම්ව කොටස් වටිනාකම ගණනය කර එය පූර්ණ සංඛ්‍යාවක් වීම සඳහා 100න් ගුණ කළ යුතු ය;

(ඊ) සම්පූර්ණ කරන ලද හෝ යෝජිත සහාධිපත්‍ය ගොඩනැගිල්ලක අනුමත ගොඩනැගිලි සැලැස්මේ දක්වා ඇති ඉඩමේ මායිම් සහ සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති ඉඩමේ මායිම් සමාන විය යුතු ය;

(උ) ගොඩනැගිල්ලක් හෝ දේපළක් සම්බන්ධයෙන් සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ඉදිරිපත් කරනු ලබන විට, ගොඩනැගිලි අවසරපත්‍රයේ වලංගුභාවය කල් ඉකුත් නොවී පැවතිය යුතු අතර අනුමත ගොඩනැගිලි අවසරපත්‍රයේ යොමු අංකය සහ දිනය අදාළ සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කරනු ලැබිය යුතු ය;

(ඌ) නේවාසික කාර්යක් සහ වෙනත් යම් කාර්යයක් වැනි මිශ්‍ර කාර්යයන් උදෙසා සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් භාවිතා කරනු ලබන අවස්ථාවක දී, ගොඩනැගිල්ලේ භාවිතයට අවහිර නොවන පරිදි විශේෂ අංක සහිත වෙන් වූ වාහන ගාල් කිරීමේ ප්‍රදේශ වෙන්ව සීමාංකනය කළ යුතු ය;

(එ) අර්ධ සහාධිපත්‍ය පිඹුරක දක්වා ඇති ගොඩනැගිලි ස්ථිර රේඛාවලින් දැක්විය යුතු අතර, යෝජිත කොටස් කඩ ඉරිවලින් හෝ වෙනත් යම් ක්‍රමවේදයක් භාවිතා කොට ගොඩනැගිල්ල පහසුවෙන් හඳුනාගත හැකි ආකාරයට දැක්විය යුතු ය;

(ඒ) එක් එක් කොටසේ පිහිටීම අනුව සහ මහලට අදාළව වෙන්කොට දෙන ලද තනි අංක, වරිපනම් අංකයක් තිබේ නම් එම වරිපනම් අංකය, මහලේ හෝ කොන්ක්‍රීට් බිමෙහි මධ්‍ය රේඛාවට අදාළව දක්වා ඇති පැති හයෙහි මායිම් විස්තර, කොටසෙහි වර්ග ප්‍රමාණය, වර්ග ප්‍රමාණයෙහි කොටස් වටිනාකමෙහි ප්‍රතිශතය, ආසන්නතම යාබද පොදු ප්‍රවේශය සහ පොදු අංගෝපාංග පිළිබඳ විස්තර පිඹුරේ ඇතුළත් කළ යුතු අතර, හඳුනා ගැනීම පහසුවන පරිදි එක් එක් කොටසේ මායිම් සලකුණු කර එක් එක් කාමරයේ කාර්ය සමඟ පිඹුරේ ඇතුළත් කළ යුතු ය;

(ඔ) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය පිඹුරක්, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් සකස් කිරීමේ දී, ආබාධිත තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ වන නීති ද සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(ඕ) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය පිඹුරක්, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් සංශෝධනය කිරීමේ දී, පූර්ව ලියාපදිංචි පිඹුරේ සඳහන් කර ඇති කොටස් වටිනාකම සහ සංශෝධිත පිඹුරේ සඳහන් කර ඇති කොටස් වටිනාකම වෙන් වූ තීරුවල, පිළිවෙළින් රතු සහ කළු වර්ණයෙන්, විවිධ වටිනාකම් පහසුවෙන් හඳුනා ගත හැකිවන පරිදි දැක්විය යුතු ය.

(ක) වෙනත් කොටස්වලට ප්‍රවේශ පහසුකම නොමැති, ප්‍රධාන කොටසේ භාවිතය සඳහා පමණක් සීමා වූ සහ පිඹුරේ විස්තර කර ඇති සහාධිපත්‍ය කොටසට යාබදව සහ එහි පිටත මායිම්වලට පිටතින් පිහිටා ඇති ආවෘත සඳලුතල වැනි අතිරේක කොටස්වල මායිම් සහ විස්තර, උපලේඛනයේ අතිරේක කොටස් වශයෙන් වෙන්ව දැක්විය යුතු අතර ප්‍රධාන කොටසේ වර්ග ප්‍රමාණයට එකතු කළ යුතු අතරම, කොටස් වටිනාකමේ ප්‍රතිශතය ඒ අනුව ගණනය කරනු ලැබිය යුතු ය; සහ

(ග) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය දේපළ, තාවකාලික සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම එම දේපළේ අයිතිකරුගේ වගකීම වන්නේ ය.

II වන කොටස

අවකාශය වෙන් කිරීම

8. අවස්ථාවෝචිත පරිදි, සාහාධිපත්‍ය දේපළක, තාවකාලික සහාධිපත්‍ය දේපළක හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක අවකාශය වෙන් කිරීම සැලසුම් කිරීමේ දී පහත කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු යː-

(අ) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය දේපළක, තාවකාලික සහාධිපත්‍ය දේපළක හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක, කොටස් පහක් හෝ වැඩි ගණනක් ඇති අවස්ථාවක, කළමනාකරණ සංස්ථාව සඳහා කාර්යාල කාමරයක් සහ උපකරණ තැබීම සඳහා තවත් කාමරයක් වශයෙන් භාවිත කිරීම සඳහා ගොඩනැගිල්ල තුළ අවකාශයක් වෙන් කරනු ලැබිය යුතු ය;

(ආ) යම් අදාළ කාර්යයක් සඳහා, අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය කොටසක්, තාවකාලික සහාධිපත්‍ය කොටසක් හෝ අර්ධ සහාධිපත්‍ය කොටසක් විකිණීමට ගිවිසුමක් අත්සන් කරන අවස්ථාවේ දී, එම කොටසේ වර්ග ප්‍රමාණය අදාළ සහාධිපත්‍ය පිඹුරේ, තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති වර්ග ප්‍රමාණයට සමාන විය යුතු ය;

(ඇ) යම් සහාධිපත්‍ය කොටසක හෝ එහි කොටසක අනුමත කාර්යය වෙනස් කිරීමේ අවශ්‍යතාවක් මතු වන අවස්ථාවක දී, ඒ සඳහා කොමිෂන් සභාවෙන් පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) ප්‍රධාන ජල සැපයුම් පද්ධතිය හෝ ජලය රැස් කිරීමේ ටැංකි සපයා දීම ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනතේ 2 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ නියමයන්ට අනුකූල විය යුතු ය;

(ඉ) විදුලි සැපයුම් සහ ජල සැපයුම් මීටර් පොදු අංගෝපාංග පිහිටුවා ඇති ස්ථානයක ආරක්ෂිතව සවි කරනු ලැබිය යුතු ය;

(ඊ) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය දේපළේ, තාවකාලික සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ එක් එක් කොටසේ සේවා නළ මාර්ග වෙනත් කොටස් හරහා සපයනු ලබන අවස්ථාවක දී එම අවකාශය අදාළ සහාධිපත්‍ය පිඹුරේ, තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පොදු අංගෝපාංගයක් ලෙස දැක්විය යුතු ය;

(උ) පොදු වහලය හේතුවෙන් ඇතිවන තාපය පාලනය කිරීමට හැකි වන පරිදි යම් ආකාරයක තාප රෝධක ක්‍රමයක් සැලැස්විය යුතු ය;

(ඌ) විදුලි සෝපානය සහ ස්වයංක්‍රීය ස්විචයක් මගින් දැල්වීම කරනු ලැබිය යුතු පොදු ලාම්පු සඳහා ප්‍රමාණවත් ධාරිතාවයකින් යුතු විදුලි ජනක යන්ත්‍රයක් ස්ථාපනය කරනු ලැබිය යුතු ය;

(එ) නේවාසික කොටස් සඳහා ප්‍රවේශය සපයන යම් පටු මගක් මීටර් 1.5 ක අවම පළලින් යුක්ත විය යුතු ය;

(ඒ) සඳලුතල බිත්තිවල උස ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව විය යුතු ය;

(ඔ) යම් කොන්ත්‍රාත්කරුවකු, සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වගකීම් සහතිකය ප්‍රකාරව වගකීමේ කාලසීමාව ඇතුළත වගකීම් ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, දේපළේ අයිතිකරු හෝ සංවර්ධකයා එකී වගකීම් ඉටු කිරීමට බැඳී සිටිය යුතු ය.

III වන කොටස

සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ සහ කොටස් පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

9\. අවස්ථාවෝචිත පරිදි, යම් සහාධිපත්‍ය දේපළක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක් හෝ සහාධිපත්‍ය කොටසක් කළමනාකරණය කිරීමේ දී පහත කරුණුවලට අනුකූලව කටයුතු කර ඇති බවට සහතික වීම යම් කළමනාකරණ සංස්ථාවක වගකීම විය යුතු යː-

(අ) ලියාපදිංචි සාහාධිපත්‍ය පිඹුරක වාහන ගාල් කිරීමේ ප්‍රදේශ පොදු අංගෝපාංග ලෙස අර්ථ දක්වා ඇති අවස්ථාවක දී, සෑම පදිංචිකරුවකුටම, එම වාහන ගාල් කිරීමේ ප්‍රදේශය තුළ ප්‍රථමයෙන් පැමිණෙන තැනැත්තාට ප්‍රථමයෙන් සේවා සැපයීමේ පදනම මත තම වාහනය ගාල් කිරීමේ පොදු අයිතියක් තිබෙන්නේ යː

එසේ වුව ද, වාහන ගාල් කිරීමේ කොටස් සහාධිපත්‍ය කොටසක අතිරේක කොටස් ලෙස හඳුනාගනු ලබන අවස්ථාවක දී, එකී කොටසේ අයිතිකරුට එකී අතිරේක කොටසේ ප්‍රදේශය තුළ තම වාහනය ගාල් කිරීමේ පරම අයිතිය තිබිය යුතු ය;

(ආ) සහාධිපත්‍ය කොටසක අභ්‍යන්තරයේ මළකෑමක් හෝ කාන්දු වීමක් ඇති වූ අවස්ථාවක, එම මළකෑමේ හෝ කාන්දු වීමේ ස්වභාවය තාක්ෂණික වාර්තාවක් මගින් හඳුනාගෙන ඇති විට, වගකිව යුතු පාර්ශ්වය විසින් එම මළකෑම හෝ කාන්දුව අලුත්වැඩියා කරනු ලැබිය යුතු අතර, එසේ එම පාර්ශ්වය එය අලුත්වැඩියා කිරීමට අපොහොසත් වන්නේ නම්, කළමනාකරණ සංස්ථාව විසින් එය අලුත්වැඩියා කොට, අලුත්වැඩියා කිරීමේ පිරිවැය එම පාර්ශ්වයෙන් අයකර ගනු ලැබිය යුතු ය;

(ඇ) කිසිදු තැනැත්තකු විසින් යම් සහාධිපත්‍ය කොටසක අනෙකුත් පදිංචිකරුවන්ට පොදු පහසුකම් භාවිත කිරීමට අවහිර වන යම් ආකාරයකට හෝ එහි අනෙකුත් පදිංචිකරුවන්ට අපහසුතා ඇතිවන ආකාරයට ඒ සහාධිපත්‍ය කොටස භාවිත කරනු නොලැබිය යුතු ය;

(ඈ) කළමනාකරණ සංස්ථාව විසින් ගිනි නිවීමේ උපකරණ නඩත්තු කිරීම අඛණ්ඩව කළ යුතු අතර ඒවායේ නිසි ක්‍රියාකාරිත්වය සහතික කළ යුතු ය;

(ඉ) කළමනාකරණ සංස්ථාව විසින්, මේ නියෝග ක්‍රියාත්මක වන දිනයේ සිට, සහාධිපත්‍ය කොටස්වල කොටස් වටිනාකමට සමානුපාතිකව කළමනාකරණ ගාස්තු අයකරගත යුතු ය;

(ඊ) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය දේපළක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක් ලියාපදිංචි නොකිරීමක් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක් කොමිෂන් සභාව ඉදිරියේ විභාග වෙමින් පවතින අවස්ථාවක, කිසිදු තැනැත්තකු විසින් කොමිෂන් සභාවේ අනුමතයෙන් තොරව වෙනත් කිසිදු සහාධිපත්‍ය කොටසක් විකිණීම, උකසට දීම හෝ බද්දට දීම කරනු නොලැබිය යුතු ය; සහ

(උ) සහාධිපත්‍ය දේපළවලට අදාළ සහාධිපත්‍ය පිඹුරු හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරු ලියාපදිංචි කිරීමෙන් අනතුරුව ඒවායෙහි ගැනුම්කරුවන් වෙත එම සහාධිපත්‍ය කොටස්වල හිමිකම් ඔප්පු නිකුත් කරනු ලැබ නොමැති අවස්ථාවක, එම දේපළේ අයිතිකරුට හෝ සංවර්ධකයාට, අනාගත ගැනුම්කරුවන්ගේ අයිතිවාසිකම්වලට බලපෑම් ඇති කළ හැකි කිසිදු රීතියක් කළමනාකරණ සංස්ථාවේ රැස්වීමක දී සැදීමට කිසිදු බලයක් නොතිබෙන්නේ ය.

IV වන කොටස

සාමාන්‍ය විධිවිධාන

10. යම් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි යම් සහාධිපත්‍ය දේපළක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අනුකූලතා සහතිකයක් තිබේ නම් මිස, ඒ තැනැත්තා විසින් එම සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ පදිංචි වීම සිදු නොකළ යුතු ය.

11. මේ නියෝගවල-

"බද්ධ නිවාස අයිතිකම් පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව අදහස් වේ; සහ

"සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත අදහස් වේ.

I වන උපලේඛනය

2 (1) වන නියෝගය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි		
අංකය	:	....
ලැබූ දිනය	:	....
මුදල් ගෙවූ දිනය	:	....

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව

සහාධිපත්‍ය දේපළක පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පිළිබඳ සහතිකයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය

1. අයිතිකරුගේ/ අයිතිකරුවන්ගේ නම/ නම් : ....

2. ජාතික හැඳුනුම්පත් අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය/ සමාගම් ලියාපදිංචි අංකය : ....
....

3. තැපැල් ලිපිනය : ....

4. විද්‍යුත් ලිපිනය : ....

5. දුරකථන අංක : ....

6. සහාධිපත්‍ය දේපළෙහි නම : ....

7. සහාධිපත්‍ය දේපළෙහි ලිපිනය : ....

8. සහාධිපත්‍ය කොටස් ගණන : ....

   (i) නේවාසික : .... (ii) වාණිජ : ....

9. සහාධිපත්‍ය දේපළෙහි බිමෙහි වර්ග ප්‍රමාණය : ව.මී. ....

   (i) මිනින්දෝරුවරයාගේ නම : .... (ii) සහාධිපත්‍ය පිඹුරු අංකය : ....

10. සමාගමක් වන විට සමාගමේ විස්තර : ....

11. ඉඩම් හිමිකම් ඔප්පුව : ....

12. ව්‍යාපෘතිය සඳහා ණයක් ලබාගෙන ඇත්නම්, උකස්කර සහ අනෙකුත් බැඳීම් පිළිබඳ විස්තර : ....
....

13. විකුණුම් ගිවිසුම් පිළිබඳ විස්තර සහ සහාධිපත්‍ය කොටස් අයිතිකරුවන් පිළිබඳ විස්තර : ....
....

14. සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමට අපේක්ෂිත කාලසීමාව : ....

15. ඇමුණුම් ː-

(අ) කොමිෂන් සභාව විසින් අවසන් වරට අනුමත කළ සංශෝධන සහිත ගොඩනැගිලි සැලැස්ම (මුල් පිටපත සහ වරලත් වාස්තු විද්‍යාඥයෙකු සහ වරලත් ව්‍යුහ ඉංජිනේරුවකු විසින් සහතික කරන ලද පිටපත් දෙකක්)

යොමු අංකයඃ	දිනයඃ

(ආ) සභාධිපත්‍ය පිඹුර (මුල් පිටපත/ දෙවන පිටපත/ තුන්වන පිටපත)

යොමු අංකයඃ	දිනයඃ

(ඇ) කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අනුකූලතා සහතිකය (මුල් පිටපත සහ පිටපත් දෙකක්)

යොමු අංකයඃ	දිනයඃ

(ඈ) ඉඩමේ හිමිකම් ඔප්පුව (මුල් පිටපත සහ පිටපත් දෙකක්)

යොමු අංකයඃ	දිනයඃ

(ඉ) නඩත්තු කිරීම පිළිබඳ කළමනාකරණ යෝජනා (සමාගමක් වන විට දී, අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කර සමාගමේ මුද්‍රාව සහිතව තිබිය යුතු ය.)

යොමු අංකයඃ	දිනයඃ

(ඊ) අදාළ සුදුසුකම්ලත් තැනැත්තන් විසින් සහතික කරන ලද ඉදිකිරීමට අදාළ පහත දැක්වෙන සැලසුම්/රේඛා චිත්‍ර ː-

(i) ජල සැපයුම පිළිබඳ සැලැස්ම;

(ii) අපජලය බැහැර කිරීම පිළිබඳ සැලැස්ම;

(iii) මලාපවහනය පිළිබඳ සැලැස්ම;

(iv) වැසි ජලය බැහැර කිරීම පිළිබඳ සැලැස්ම;

(v) කසළ කළමනාකරණය පිළිබඳ සැලැස්ම;

(vi) විදුලි සැපයුම පිළිබඳ සැලැස්ම;

(vii) දුරකථන පහසුකම් සැපයීම පිළිබඳ සැලැස්ම;

(viii) විදුලි සෝපාන සැපයීම පිළිබඳ සැලැස්ම;

(ix) ගිනි ආරක්ෂණය සැපයීම පිළිබඳ සැලැස්ම;

(x) ව්‍යුහාත්මක රේඛා චිත්‍ර; සහ

(xi) වෙනත් සේවාවන් සඳහා වන සැලසුම්.

මම/ අපි ඉදිරිපත් කරන ඉහත තොරතුරු සත්‍ය බවට සහතික වෙමි/ වෙමු.

....	....	....
අයිතිකරුගේ/ අයිතිකරුවන්ගේ හෝ ඉල්ලුම්කරුගේ අත්සන	වරලත් ඉංජිනේරුවරයාගේ/ වරලත් වාස්තු විද්‍යාඥයාගේ අත්සන	ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ අත්සන
....	....	....
දිනය	දිනය	දිනය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

වෙනත් සටහන්

II වන උපලේඛනය

2 (2) වන නියෝගය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි		
අංකය	:	....
ලැබූ දිනය	:	....
මුදල් ගෙවූ දිනය	:	....

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව

තාවකාලික සහාධිපත්‍ය දේපළක පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පිළිබඳ සහතිකයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය

1. අයිතිකරුගේ/ අයිතිකරුවන්ගේ නම/ නම් : ....
2. ජාතික හැඳුනුම්පත් අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය/ සමාගම් ලියාපදිංචි අංකය : ....
....
3. තැපැල් ලිපිනය : ....
4. විද්‍යුත් ලිපිනය : ....
5. දුරකථන අංක : ....
6. තාවකාලික සහාධිපත්‍ය දේපළෙහි නම : ....
7. තාවකාලික සහාධිපත්‍ය දේපළෙහි ලිපිනය : ....
8. සහාධිපත්‍ය කොටස් ගණන : ....
   (i) නේවාසික : .... (ii) වාණිජ : ....
9. තාවකාලික සහාධිපත්‍ය දේපළෙහි බිමෙහි වර්ග ප්‍රමාණය : ව.මී. ....
   (i) මිනින්දෝරුවරයාගේ නම : .... (ii) සහාධිපත්‍ය පිඹුරු අංකය : ....
10. ඇමුණුම් :-

(අ) කොමිෂන් සභාව විසින් අවසන් වරට අනුමත කළ සංශෝධන සහිත ගොඩනැගිලි සැලැස්ම

යොමු අංකයː	දිනයː

(ආ) තාවකාලික සහාධිපත්‍ය පිඹුර (මුල් පිටපත/ දෙවන පිටපත/ තුන්වන පිටපත)

යොමු අංකයː	දිනයː

(ඇ) බද්ධ නිවාස අයිතිකම් පනත ප්‍රකාරව සුදුසුකම්ලත් තැනැත්තකු විසින් සකස්කර අත්සන් කරන ලද ඉදිකිරීමට අදාළ යෝජිත සංවර්ධන වැඩසටහන

යොමු අංකයඃ	දිනයඃ

(ඈ) ඉඩමේ හිමිකම් ඔප්පුව (මුල් පිටපත සහ පිටපත් දෙකක්)

යොමු අංකයඃ	දිනයඃ

(ඉ) නඩත්තු කිරීම පිළිබඳ කළමනාකරණ යෝජනා (සමාගමක් වන විට දී, අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කර සමාගමේ මුද්‍රාව සහිතව තිබිය යුතු ය.)

යොමු අංකයඃ	දිනයඃ

(ඊ) අදාළ සුදුසුකම්ලත් තැනැත්තන් විසින් සහතික කරන ලද ඉදිකිරීමට අදාළ පහත දැක්වෙන සැලසුම්/රේඛා චිත්‍ර ඃ-

(i) ජල සැපයුම පිළිබඳ සැලැස්ම;

(ii) අපජලය බැහැර කිරීම පිළිබඳ සැලැස්ම;

(iii) මලාපවහනය පිළිබඳ සැලැස්ම;

(iv) වැසි ජලය බැහැර කිරීම පිළිබඳ සැලැස්ම;

(v) සහ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සැලැස්ම;

(vi) විදුලි සැපයුම පිළිබඳ සැලැස්ම;

(vii) දුරකථන පහසුකම් සැපයීම පිළිබඳ සැලැස්ම;

(viii) විදුලි සෝපාන සැපයීම පිළිබඳ සැලැස්ම;

(ix) ගිනි ආරක්ෂණය සැපයීම පිළිබඳ සැලැස්ම;

(x) ව්‍යුහාත්මක රේඛා චිත්‍ර; සහ

(xi) වෙනත් සේවාවන් සඳහා වන සැලසුම්.

මම/ අපි ඉදිරිපත් කරන ඉහත තොරතුරු සත්‍ය බවට සහතික වෙමි/ වෙමු.

....	....	....
අයිතිකරුගේ/ අයිතිකරුවන්ගේ හෝ ඉල්ලුම්කරුගේ අත්සන	වරලත් ඉංජිනේරුවරයාගේ/ වරලත් වාස්තු විද්‍යාඥයාගේ අත්සන	ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ අත්සන
....	....	....
දිනය	දිනය	දිනය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

වෙනත් සටහන්

III වන උපලේඛනය

2 (3) වන නියෝගය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි		
අංකය	:	....
ලැබූ දිනය	:	....
මුදල් ගෙවූ දිනය	:	....

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව

අර්ධ සහාධිපත්‍ය දේපළක පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පිළිබඳ සහතිකයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය

1. අයිතිකරුගේ/ අයිතිකරුවන්ගේ නම/ නම් : ....

2. ජාතික හැඳුනුම්පත් අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය/ සමාගම් ලියාපදිංචි අංකය : ....
....

3. තැපැල් ලිපිනය : ....

4. විද්‍යුත් ලිපිනය : ....

5. දුරකථන අංක : ....

6. අර්ධ සහාධිපත්‍ය දේපළෙහි නම : ....

7. අර්ධ සහාධිපත්‍ය දේපළෙහි ලිපිනය : ....

8. අර්ධ සහාධිපත්‍ය කොටස් ගණන : ....

   (i) නේවාසික : .... (ii) වාණිජ : ....

9. අර්ධ සහාධිපත්‍ය දේපළෙහි බිමෙහි වර්ග ප්‍රමාණය : ව.මී. ....

   (i) මිනින්දෝරුවරයාගේ නම : .... (ii) අර්ධ සහාධිපත්‍ය පිඹුරු අංකය : ....

10. සහතිකලත් සමාගමේ විස්තර : ....

11. ඉඩමේ හිමිකම් ඔප්පුව : ....

12. ව්‍යාපෘතිය සඳහා යම් ණයක් ලබාගෙන ඇත්නම්, උකස්කර සහ අනෙකුත් බැඳීම් පිළිබඳ විස්තර : ....
....

13. විකුණුම් ගිවිසුම් පිළිබඳ විස්තර සහ සහාධිපත්‍ය කොටස් අයිතිකරුවන් පිළිබඳ විස්තර : ....
....

14. අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමට අපේක්ෂිත කාලසීමාව : ....

15. ඇමුණුම් ඃ-

(අ) කොමිෂන් සභාව විසින් අවසන් වරට අනුමත කළ සංශෝධන සහිත ගොඩනැගිලි සැලැස්ම (මුල් පිටපත සහ වරලත් වාස්තු විද්‍යාඥයෙකු සහ වරලත් ව්‍යුහ ඉංජිනේරුවකු විසින් සහතික කරන ලද පිටපත් දෙකක්)

යොමු අංකයඃ	දිනයඃ

(ආ) අර්ධ සභාධිපත්‍ය පිඹුර (මුල් පිටපත/ දෙවන පිටපත/ තුන්වන පිටපත)

යොමු අංකයඃ	දිනයඃ

(ඇ) සම්පූර්ණ කරන ලද කොටස් සඳහා අනුකූලතා සහතිකය

යොමු අංකයඃ	දිනයඃ

(ඈ) බද්ධ නිවාස අයිතිකම් පනත ප්‍රකාරව සුදුසුකම්ලත් තැනැත්තකු විසින් සකස් කර අත්සන් කරන ලද ඉදිකිරීමට අදාළ යෝජිත සංවර්ධන වැඩසටහන

යොමු අංකයඃ	දිනයඃ

(ඉ) ඉඩමේ හිමිකම් ඔප්පුව (මුල් පිටපත සහ පිටපත් දෙකක්)

යොමු අංකයඃ	දිනයඃ

(ඊ) නඩත්තු කිරීම පිළිබඳ කළමනාකරණ යෝජනා (සමාගමක් වන විට දී, අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කර සමාගමේ මුද්‍රාව සහිතව තිබිය යුතු ය.)

යොමු අංකයඃ	දිනයඃ

(උ) අදාළ සුදුසුකම්ලත් තැනැත්තන් විසින් සහතික කරන ලද ඉදිකිරීමට අදාළ පහත දැක්වෙන සැලසුම්/රේඛා චිත්‍ර ඃ-

(i) ජල සැපයුම පිළිබඳ සැලැස්ම;
(ii) අපජලය බැහැර කිරීම පිළිබඳ සැලැස්ම;
(iii) මලාපවහනය පිළිබඳ සැලැස්ම;
(iv) වැසි ජලය බැහැර කිරීම පිළිබඳ සැලැස්ම;
(v) කසළ කළමනාකරණය පිළිබඳ සැලැස්ම;
(vi) විදුලි සැපයුම පිළිබඳ සැලැස්ම;
(vii) දුරකථන පහසුකම් සැපයීම පිළිබඳ සැලැස්ම;
(viii) විදුලි සෝපාන සැපයීම පිළිබඳ සැලැස්ම;
(ix) ගිනි ආරක්ෂණය සැපයීම පිළිබඳ සැලැස්ම;
(x) ව්‍යුහාත්මක රේඛා චිත්‍ර; සහ
(xi) වෙනත් සේවාවන් සඳහා වන සැලසුම්.

මම/ අපි ඉදිරිපත් කරන ඉහත තොරතුරු සත්‍ය බවට සහතික වෙමි/ වෙමු.

....	....	....
අයිතිකරුගේ/ අයිතිකරුවන්ගේ හෝ ඉල්ලුම්කරුගේ අත්සන	වරලත් ඉංජිනේරුවරයාගේ/ වරලත් වාස්තු විද්‍යාඥයාගේ අත්සන	ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ අත්සන
....	....	....
දිනය	දිනය	දිනය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

වෙනත් සටහන්

IV වන උපලේඛනය

3 (1) (ආ) වන නියෝගය

පොදු පහසුකම්වලට අදාළ සේවා සහ සැලසුම් සම්බන්ධ වාර්තා සහතික කිරීම සඳහා බලය පැවරී ඇති සුදුසුකම්ලත් තැනැත්තන්

	වාර්තාව/ සැලැස්ම	*වාර්තාව/ සැලැස්ම අනුමත කිරීමට හෝ සහතික කිරීමට බලය පැවරී ඇති සුදුසුකම්ලත් තැනැත්තන්*
1.	සහාධිපත්‍ය පිඹුර/ අර්ධ සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර	බලයලත් මිනින්දෝරුවරයකු හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් බලය පවරා ඇති තැනැත්තෙක්
2.	සැලසුම් ගණනය කිරීම් සහ චිත්‍ර රේඛා සමඟ ව්‍යුහාත්මක සැලසුම් වාර්තාව (අත්තිවාරම සහ ගොඩනැගිල්ල අනුමත සැලැස්මට අනුකූල වන බව සහ ගොඩනැගිල්ල ව්‍යුහාත්මකව සුරක්ෂිත බව දක්වන සහතිකය)	ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයෙක් වන සහ 1968 අංක 17 දරන පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පළ කරන ලද ව්‍යුහ ඉංජිනේරුවන්ගේ නාමාවලියට අනුව අදාළ ගොඩනැගිලි වර්ගය සඳහා සුදුසුකම්ලත් වරලත් සිවිල් ඉංජිනේරුවරයෙක්
3.	විදුලි සැපයුම, ජල සැපයුම, අපජලය බැහැර කිරීම, (වැසි ජලය රැස් කිරීම ඇතුළුව) පිටාර ජලය කළමනාකරණය සහ ගිනි ආරක්ෂණය සම්බන්ධ සැලසුම් ගණනය කිරීම් සහ චිත්‍ර රේඛා සමඟ ගොඩනැගිලි සේවා සැලසුම් වාර්තාව	ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයන් වන සහ 1968 අංක 17 දරන පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පළ කරන ලද නාමාවලීන්ට අනුව අදාළ ක්ෂේත්‍ර සඳහා සුදුසුකම්ලත් පහත දැක්වෙන ඉංජිනේරුවරුන් ගෙන් යම් ඉංජිනේරුවරයෙක්:- (i) වරලත් විදුලි ඉංජිනේරුවරයෙක්; (ii) වරලත් සිවිල් ඉංජිනේරුවරයෙක්; (iii) වරලත් ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරයෙක්; (iv) වරලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක්;
4.	කසළ අපහරණය සඳහා යෝජනාව	දේපළ කළමනාකරණ සංස්ථාව
5.	ගිනි නිවීම් පිළිබඳ සහතිකය	නගර සභාවේ ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව
6.	වියදම් ඇස්තමේන්තුව	ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු වන වරලත් සිවිල් ඉංජිනේරුවරයකු හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු වන වරලත් ප්‍රමාණ සමීක්ෂකවරයෙක්.

EOG 07 - 0269

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.